# රබර් වගාව සඳහා ළපටි බද්ධ පැළ

ප්‍රියානි සෙනෙවිරත්න


රබර් ශාකය ප්‍රචාරණය සඳහා බද්ධ කිරීමේ ක්‍රමය හඳුන්වා දීමත් සමඟම රබර් වගාවන් ගෙන් ලද හැකි වූ ආදයම වැඩිවූවා පමණක් නොව වගාවකින් ලද හැකි ඵලදාව හෝ ආදයම හෝ කල් තියා දැන ගත හැකි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස උසස් ගුණාංග සහිත ශාක හඳුනා ගත් පසු ඒවා 'ක්ලෝන' ලෙස නම්කර බද්ධ අතු තවාන් ආකාරයට පවත්වා ගනු ලැබූ අතර, අවශ්‍ය වූ විට ඒවායෙන් ලබා ගත් බද්ධ පොතු ග්‍රාහක පැලවලට බද්ධ කර එම ක්ලෝනයෙන් පැල නිපදවනු ලැබී ය.

රබර් සඳහා පැල බද්ධ කිරීම සලකා බලන කල ප්‍රධාන වශයෙන් ක්‍රම දෙකක් දක්නට ලැබේ. එනම්, දුඹුරු බද්ධය සහ හරිත බද්ධය යි. මෙම ක්‍රම දෙක අතර ඇති ප්‍රධානතම වෙනස නම් මේ සඳහා යොදා ගනු ලබන ග්‍රාහක පැල සහ බද්ධ අතුවල වයස යි. දුඹුරු බද්ධය සඳහා යොදා ගන්නා ග්‍රාහක පැල සහ බද්ධ අතු අවුරුද්දක් පමණ වයස් වන අතර මේ අවස්ථාවේදී බද්ධ අතු දුඹුරු පැහැති පොත්ත සහිත වේ. හරිත බද්ධය සඳහා යොදා ගන්නා බීජ පැල මාස 6 පමණ වන අතර, බද්ධ අතු මාස $2\frac{1}{2}$–3 පමණ වේ. මේ අවස්ථාවේදී බද්ධ අතු කොළ පැහැයෙන් යුක්ත වේ. බද්ධ කිරීමේ සාර්ථකත්වය අතින් බලන කල මෙම ක්‍රම දෙක ම සමාන ප්‍රතිඵල ලබා දෙන අතර, හරිත බද්ධය දැන් තවාන් හිමියන් අතර ජනප්‍රිය වෙමින් පවතී. එයට හේතුව කලින් සඳහන් කළ පරිදි ග්‍රාහක පැල, තවානේ නඩත්තු කළ යුතු කාලය අඩු වීම සහ ඒ මගින් වියදම අඩු වීමයි.

මෙ ලෙසට, දුඹුරු බද්ධය මගින් හෝ හරිත බද්ධය මගින් හෝ නිපදවන බද්ධ පැල නග්න මූල බද්ධ පැල ලෙසට ක්ෂේත්‍රයේ සිටවුවහොත්, අඩුතරමින් 10% පමණ වත් ක්ෂේත්‍රයේ ස්ථාපනය නොවීමට හෝ ඉතා දුර්වල ලෙස වර්ධනය වීමට හෝ ඉඩ ඇත. පොලිතින් මලු පැල භාවිතයෙන් මෙය සෑහෙන දුරට අඩු කර ගත හැකි වනවා මෙන් ම, හොඳින් සහ ඒකාකාරීව වර්ධනය වන පැල පමණක් තෝරා ගෙන සිටු වීමට ද අවස්ථාවක් ලැබේ. එමෙන් ම පොලි-තින් මලු පැල ක්ෂේත්‍රයට මාරු කිරීම නිසි අයුරින් නිර්දේශිත පිළිවෙලට කළ හොත්, වර්ධනයේ කිසිදු පසුබෑමක් සිදු නො වේ. සාමාන්‍යයෙන් පොලිතින් මලු තුල වර්ධනය කෙරෙනුයේ කොල මාල 2–3 අවධිය දක්වා පමණි. නමුත් තරමක් ලොකු ප්‍රමාණයේ පොලි තින් මල්ලක් භාවිතා කිරීමෙන් කොල මාල 5–6 අවධිය දක්වා තබා ගත හැකි අතර මෙම පැල භාවිතා කිරීමෙන් වගාවේ අපරිණත කාලය අවුරුද්දකට ආසන්න කාලයකින් අඩු කර ගත හැකි වනු ඇත.

ළපටි බද්ධ පැල ද පොලිතින් මලු තුල වර්ධනය වන වැවින් ඒවා පොලිතින් මලු පැල වල දක්නට ලැබෙන සියලු උසස් ගුණාංගයන් ගෙන් සමන්විත වේ. ළපටි බද්ධ පැල යනු, ඉතා සරළව කිව හොත් පොලිතින් මලු තුළ වවන ලද ග්‍රාහක පැල මාස තුනක පමණ වර්ධන අවධියේ දී හරිත බද්ධ ක්‍රමය මගින් බද්ධ කර නිපදවූ පැල යි. ළපටි බද්ධ පැල නිපදවීම සඳහා යොදා ගනු ලබන ප්‍රරෝහණය වූ බීජ, කෙලින් ම පොලිතින් මල්ල තුල සිටවන නිසා, ග්‍රාහක පැලයේ මූල පද්ධතියට කිසිදු ලෙය කට හානියක් සිදු නො වේ.

ළපටි බද්ධ පැල නිපදවීමට ග්‍රාහක තවාන් සෑදීමක් අවශ්‍ය නො වේ. ඒ වෙනුවට පස් පිරවූ පොලිතින් මලු පේළි වශයෙන් තබා තවානක් ලෙසට පවත්වා ගනු ලබයි. එ මෙන් ම සාමාන්‍ය පොලිතින් මලු පැල තවානක් මෙන් ආවරනයක්


1
2
3
4

යෙදීම ද අවශ්‍ය නො වේ. තව ද, මාස 3 වැනි කෙටි කාලයක දී බද්ධ කිරීම සිදු කරන නිසා තවානේ පැල නඩත්තු කළ යුතු කාලය සැහෙන ප්‍රමාණයකින් අඩු වන අතර ඒ අනුව නිෂ්පාදන වියදම ද සැහෙන ප්‍රමාණයකින් අඩු වේ. සාමාන්‍ය දුඹුරු හෝ හරිත හෝ බද්ධයේ දී, බද්ධ කරන අවස්ථාවේදී පැලවල ඉහලින් ම ඇති කොල මාලය මේරූ තත්ත්වයේ තිබීම අවශ්‍ය වේ. ළපටි බද්ධය සඳහා මෙය අදාල නොවන අතර එබැවින් එක වර බද්ධ කළ හැකි පැල සංඛ්‍යාව වැඩි වනවා පමණක් නොව බද්ධ කරන්නාට ද පහසු වේ.

ග්‍රාහක තවානක් භාවිතා නොකිරීමෙන් ලැබෙන අමතර වාසියක් නම්, සුදු මුල් රෝගය වැනි රෝග සාදන රෝග කාරක දිලීර, තවානෙන් ක්ෂේත්‍රය වෙතට හඳුන්වා දීම මගහැරීම යි. මෙ ලෙසට රෝග පැතිරීමට ඇති සම්භාවිතාවය ඉතා අඩු වුවද රබර් ශාකයේ දිගු ජීවිත කාලය සහ මෙවැනි රෝගවල ඇති භයානක ඵල විපාක ගැන සලකා බලන විට, සුලු අවස්ථාවක් හෝ මගහරවා ගැනීම ඉතා වැදගත් වේ.

තවද, බද්ධ කිරීමෙන් පසු ග්‍රාහක කඳෙන් කපා ඉවත් කරන කොටස, එනම් අපතේ යවන කොටස, ගැන සලකා බලන කල එය දුඹුරු බද්ධය හෝ හරිත බද්ධයේදී හෝ මෙන් නොව ඉතා කුඩා කොටසකි. එ මෙන් ම කුඩා ප්‍රමාණයේ පැලය සහ බෑගය නිසා මේවා ප්‍රවාහණය පහසු මෙන් ම ලාබදයක ද වේ. කඳු බෑවුම් සහිත ඉඩමක වුව ද, එක් අයෙකුට පහසුවෙන් පැල 3-4 ගෙන යා හැකි වේ.

මෙ ලෙසට ළපටි බද්ධ පැල නිපදවීමෙන් තවාන් හිමියා ද, ඒවා භාවිතා කිරීමෙන් ඉඩම් හිමියා ද, එක් ලෙසට වාසි අත් කර ගනිති. තවාන් හිමියාට ලැබෙන ප්‍රධානතම වාසිය නම් අඩු කාලයකින් සහ අඩු වියදමකින් පැල නිෂ්පාදනය කිරීමට හැකි වීම යි. ඉඩම් හිමියාට ලැබෙන ප්‍රධාන වාසිය නම් හොඳ තත්ත්වයේ පැල යොදා ගෙන වගාව ආරම්භ කිරීමට හැකි වීම යි.

ළපටි බද්ධය ලංකාවේ සාර්ථක වීමට තවත් එක් හේතුවක් නම් එය ලංකාවේ කාල ගුණික තත්ත්ව සමඟ ඉතා හොඳින් ගැලපීම යි. එනම්, ලංකාවේ රබර් වගා කරන ප්‍රදේශ වලට වැසි ලැබෙන ප්‍රධාන මෝසම් කාලය වන ජූනි-ජූලි මාසවල දී වගාවන් ආරම්භ කිරීම සඳහා ඊට කලින් අවුරුද්දේ අගෝස්තු මාසයේ දී එකතු කර ගන්නා ඇටවලින් ළපටි බද්ධ පැල නිපදවිය හැකි වේ.

කෙසේ හෝ, ළපටි බද්ධ පැල සාර්ථක ව නිපදවීමට සහ ඒ මගින් ලැබෙන වාසි නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමට නම්, හොඳ තත්ත්වයේ ඇට සහ බද්ධ අතු භාවිතා කිරීමත්, නිර්දේශිත පිළිවෙලට පැල නඩත්තු කිරීමත් අවශ්‍ය වේ.

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය මගින් ප්‍රකාශ කර ඇති ''උපදේශක පත්‍රිකා අංක 1994/01 ළපටි බද්ධය'' හි ළපටි බද්ධ පැල නිෂ්පාදනය පිළිබඳ ව සම්පූර්ණ විස්තරයක් සපයා ඇත.

රූපය:
1. ප්‍රරෝහණය වූ බීජ පොලිතීන් මලු තුළ සිටුවීමට සුදුසු අවස්ථාව.
2. ළපටි බද්ධ පැල තවාන - බද්ධ කරන කාලය
3. සාර්ථකව බද්ධ කළ පැලයක් (හරිත බද්ධ ක්‍රමය මගින්)
4. කොල මාල 2 සහිත ළපටි බද්ධ පැලයක්.